**පීඨාධිපති කාර්යාලය** — **OFFICE OF THE DEAN**

මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය — FACULTY OF HUMANITIES AND SOCIAL SCIENCES
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය — UNIVERSITY OF SRI JAYEWARDENEPURA


USJ/FHSS/

## 2015/2016 සහ 2016/2017 ප්‍රතිඵල නිකුත් කිරීම

සමස්ත ලෝකය ම අනපේක්ෂිත ව්‍යසනයකට මුහුණ දෙමින් සිටින මොහොතේ උසස් අධ්‍යාපනයේ සිහින යථාර්ථයක් කිරීම උදෙසා ගුරු - සිසු - දෙමාපිය ඇතුළු සියලු පාර්ශ්ව විසින් කරන ලද අනුපමේය කැප කිරීම්වල ප්‍රතිඵල අද්දැකීමට කාලය උදා වී ඇත. ශ්‍රී ලාංකේය සිසු දරු පරපුරට අභිමානවත් අනාගතයක් උදා කිරීමේ නොතිත් මෙහෙවරෙ හි විරාජමාන සංකේතය වූ විදුදයේ මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයේ සාඩම්බර උපාධිධාරී විද්‍යාර්ථියකු වශයෙන් එළැඹෙන 30 වන දින වන විට, 2017 වසරේ දී විදු බිමට පා තුබූ ඔබ ව අභිෂේක ගැන්වීමට හැකිවීම මේ තීරණාත්මක අවස්ථාවේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයීය මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨ ප්‍රජාව සාමූහිකව අත්පත් කරගත් ජයග්‍රහණයකි. ඔබගේ අවසන් වසර, අවසන් පරීක්ෂණයේ අපේක්ෂිත ප්‍රතිඵල එළැඹෙන ජුලි 29 වන දින සනාතන සභාවට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව ජුලි 30 වන දින නිකුත් කිරීමට අවශ්‍ය සියලු කටයුතු පීඨ පරිපාලනය විසින් සිදු කරනු ලැබ ඇත. ක්ෂණික ප්‍රතිචාර දැක්විය නොහැකි වසංගත තත්ත්වය හමුවේ වුව ද, පීඨ ආචාර්ය මණ්ඩලය විසින් කරන ලද අනභිභවනීය කැප කිරීම්, මෙම ජයග්‍රහණය පිටුපස අත්‍යන්තයෙන් ම පවතින බව කෘතවේදී ව සිහිපත් කරමි. එමෙන්ම පීඨයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලය ඉටු කළ මා හැඟි මෙහෙවර ද විශේෂයෙන් සිහිපත් කරමි. එසේ ම පීඨ සිසු දරුවන් වශයෙන් ඔබ ද අප වෙත ලබා දුන්නේ අතිමහත් සහයෝගයකි. විශේෂයෙන් ප්‍රතිඵල ලබා දෙන තුරු ඉතා ඉවසීමෙන් යුතුව සිටිමින්, විදුදය විද්‍යාර්ථියකු වශයෙන් ඔබ විසින් පෙන්වන ලද විශිෂ්ටත්වය, ඔබගේ අනාගත වෘත්තිය ජීවිතය ද ඔපවත් කරවන බව නිසැක ය.

ඒ අනුව ඔබගේ පංති සාමාර්ථ සහිත ප්‍රතිඵල 2021.07.29 දින සිට පීඨ වෙබ් අඩවියේ පළ කෙරෙනු ඇති අතර විස්තරාත්මක ප්‍රතිඵල ලේඛන ලබා ගැනීමට 2021.07.30 දින සිට අයදුම් කළ හැකිය.

මෙසේ විශ්වවිද්‍යාල අධ්‍යාපනය නිසි ලෙස අවසන් කර උපාධිධාරියකු වශයෙන් නව ලොවට පිවිසෙන ඔබගේ අනාගත ජීවිතය සර්වප්‍රකාරයෙන් ම සාර්ථක වේවා!

මහාචාර්ය ශිරාන්ත හීංකෙන්ද
පීඨාධිපති
මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය

මහාචාර්ය ශිරාන්ත හීංකෙන්ද
පීඨාධිපති
මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
නුගේගොඩ, ශ්‍රී ලංකාව.


නුගේගොඩ, ශ්‍රී ලංකාව Nugegoda, Sri Lanka 011-2758312, 011-2758313
FAX : 011-2803196
E-mail : deanfhss@sjp.ac.lk
www.fhss.sjp.ac.lk